මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ - 2013

----------------------------------------------------------------

මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557 දරන ණය ගිවිසුමේ උපලේඛන 05 හි 27 වගන්තිය හා අංක 2558 දරන ණය ගිවිසුමේ උපලේඛන 05 හි 27 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම,අරමුණු,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------

මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, කොළඹ මහ නගර සභාව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ වගකීම පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට පැවරී ඇත. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, මුහුදු හා අභ්‍යන්තර ජලයේ ගුණාත්මකභාවය ඉහල නැංවීම මඟින් නාගරික පරිසරය සහ මහ කොළඹ මිලියන 1.5 ක් වූ නාගරික හා උප නාගරික වැසියන්ගේ මහජන සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය හා සනීපාරක්ෂක තත්වයන් වර්ධනය කිරීමයි. ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 109.12 ක් වන අතර, එයින් එ.ජ.ඩො. මිලියන 94.37 ක් ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි එ.ජ.ඩො. මිලියන 14.75 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කරනු ඇත. 2010 අප්‍රේල් 09 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කළ අතර, 2014 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිත විය. කෙසේ වුවත් ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2017 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂාකිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සළකණු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ). අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව,

(ආ). ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඇ). ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව,

(ඈ). ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව,

(ඉ). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව,

(ඊ). පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුනේ ද යන බව,

(උ). අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණ පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේ ද යන බව, සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව,

(ඌ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ). ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව,

**3.** **මතය**

**-------**

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැළපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මාගේ මතය වනුයේ,

(අ). 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ). සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ). 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ). ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ගයක් ගෙන තිබූ බව සහ,

(ඊ). ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

---------------

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

----------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ව්‍යාපෘති වියදම රු. 834,577,073 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 1,493,930,206 කි. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පෙර වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| උපදේශක සේවා ගාස්තු | 125,462,716 | 226,825,983 | 474,559,741 |
| දේපළ, යන්ත්‍ර හා උපකරණ | 664,062,882 | 229,535,268 | 902,437,416 |
| මූල්‍ය වියදම් | 20,720,465 | 17,895,874 | 59,126,838 |
| සමාජමය සැහැල්ලු කිරීම් | - | 66,000 | 871,120 |
| පුහුණු වියදම් | 1,416,309 | 1,413,010 | 2,829,319 |
| වර්ධක පිරිවැය | 22,914,701 | 15,388,835 | 54,105,772 |
| | 834,577,073 | 491,124,970 | 1,493,930,206 |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, විශේෂ මෙහෙයුම් හා සාමාන්‍ය මෙහෙයුම් සඳහා වෙන් වෙන් අග්‍රිම අරමුදල් ගිණුම් දෙකක් විවෘත කර තිබුණි. 2013 වර්ෂය තුල අග්‍රිම අරමුදල් ගිණුම් දෙකෙහි මෙහෙයුම් සහ 2013 වර්ෂය අවසානයට එම ගිණුම් වල පැවති ශේෂයන් පහත දැක්වේ.

(අ) ආ.ස.බැ ණය අංක 2557 - එස්ආර්එල් එස්එල් 140 (සාමාන්‍ය මෙහෙයුම්)

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 162,633.98 | 20,680,667 |
| එකතු කළා | | |
| ඌන පූර්ණයන් | 98,709.53 | 12,990,175 |
| විදේශ විනිමය වාසිය | - | 473,034 |
| | 261,343.51 | 34,143,876 |
| අඩු කළා | | |

| | | |
|---|---|---|
| ආපසු ගැනීම් | 111,224.93 | 14,515,421 |
| | ---------------------------- | --------------------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 150,118.58 | 19,628,455 |
| | ======== | ======== |

(ආ) <u>ආ.ස.බැ ණය අංක 2558 - එස්ආර්එල් එස්එල් 141 (විශේෂ මෙහෙයුම්)</u>

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| | ---------- | ------ |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 4,300.90 | 546,906 |
| <u>එකතු කළා</u> | | |
| ඌන පූර්ණයන් | 1,749,371.42 | 224,189,587 |
| විදේශ විනිමය වාසිය | - | 2,456,117 |
| | ------------------- | ------------------- |
| | 1,753,672.32 | 227,192,610 |
| <u>අඩු කළා</u> | | |
| ආපසු ගැනීම් | 1,263,192.41 | 163,060,891 |
| | ---------------- | --------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 490,479.91 | 64,131,719 |
| | ======== | ======== |

5. විගණන නිරීක්ෂණ

----------------------

වත්කම් කළමනාකරණය

-----------------------------

ව්‍යාපෘතිය විසින් අපජල කළමනාකරණ කාර්යයන් සඳහා රු. මිලියන 577.82 ක පිරිවැයකින් මිළදී ගෙන තිබූ මෝටර් රථ, යන්ත්‍රෝපකරණ, පරිගණක හා උපාංග වැනි වත්කම් භෞතික සත්‍යාපනය කිරීම සඳහා යොදා ගැනීමට ස්ථාවර වත්කම් ලේඛණයක් ව්‍යාපෘතිය නඩත්තු කර නොතිබුණි.

මුහුදු මෝය (Sea outfalls) පුනරුත්ථාපනය කිරීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, ව්‍යාපෘති ඉංජිනේරුවන්ගේ භාවිතය සඳහා ද්විත්ව මැදිරි මෝටර් රථ 02 ක් කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතු අතර මෙම කාර්ය සඳහා ප්‍රමාණ පත්‍රවල එජඩො 100,000 ක් වෙන්කර තිබුණි. නමුත් ස්ථාවර වත්කම් ලේඛණයේ තොරතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වත්කම් වල භෞතික පැවැත්ම තහවුරුකළ නොහැකි විය.

6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

6.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අයවැය ප්‍රතිපාදන සහ තථ්‍ය අරමුදල් උපයෝජනයට අදාල, වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| | මූල්‍යනය කිරීම සඳහා ණය ගිවිසුම්වල එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුල අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත අයවැයගත ප්‍රතිපාදනය | 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලි. | රු. මිලි. | රු. මිලි. | රු. මිලි. | රු. මිලි. | එජඩො මිලි. | රු. මිලි. |
| ආසබැ | 94.37 | 10,380.70 | 810.00 | 674.90 | 2,800.00 | 9.57 | 1,245.56 |
| ශ්‍රීලංර | 14.75 | 1,622.83 | 110.00 | 110.00 | 415.00 | - | 198.69 |
| එකතුව | 109.12 | 12,003.53 | 920.00 | 784.90 | 3,215.00 | 9.57 | 1,444.25* |

* මෙම වගුවේ පෙන්නුම් කරන අගයන් මුදල් පදනම මත පිළියෙල කර තිබේ. එම නිසා, 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමුච්චිත වියදම සමඟ එකඟ නොවේ.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ඉහත තොරතුරු අනුව ව්‍යාපෘති කාලයෙන් සියයට 52 ක් ගතවීමෙන් පසුවද මුළු වෙන් කිරීම් වලින් සියයට 8.77 කට සමාන එජඩො මිලියන 9.57 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ). ව්‍යාපෘතියේ සංරචක 8 ක් සඳහා මුළු වෙන් කිරීම් වලින් සියයට 7.6 ක් වූ රු. මිලියන 920 ක් අයවැය මගින් 2013 වර්ෂය සඳහා වෙන්කර තිබුණද, මුළු ප්‍රතිපාදනයන්ගෙන්

සියයට 85 ක් එනම් රු. මිලියන 784 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි. ප්‍රතිපාදනයන්හී ඌන උපයෝජන පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | අයිතමය | 2013 වර්ෂය සඳහා වෙන්කරන ලද මුදල | 2013 වර්ෂය සඳහා තථ්‍ය වියදම | ඌන උපයෝජිත මුදල |
|---|---|---|---|---|---|
| | | ---------- | ------------- | --------------- | ------------- |
| | | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| (1) | ව්‍යාපෘති කළමනාකරණ හා ක්‍රියාත්මක කිරීමේ සහය | | | | |
| | 1.1 | ව්‍යාපෘති කළමනාකරණය (සැලසුම්, අධීක්ෂණ හා කළමනාකරණ උපදේශකයින්) සහ ආයතනික සංවර්ධන උපදේශකයින් | 180,000,000 | 150,946,624 | 29,053,376 |
| | 1.2 | පුහුණු හා වැඩමුළු | 2,000,000 | 1,811,519 | 188,481 |
| | 1.3 | කොළඹ මහ නගර සභාව (කො.ම.ස) ව්‍යාපෘති පරිපාලනය | 45,000,000 | 36,681,633 | 8,318,367 |
| (2) | ආයතනික හා මෙහෙයුම් ධාරිතා වර්ධනය | | | | |
| | 2.1 | ආයතනික සහය සඳහා උපකරණ | 10,000,000 | 2,396,386 | 7,603,614 |
| | 2.2 | ධාරිතා වර්ධනය (සනීපාරක්ෂක උපදේශන, මහජන දැනුවත් කිරීම් කටයුතු, රාජ්‍ය නොවන සංවිධාන) | 6,000,000 | - | 6,000,000 |
| (3) | මළාපවහන යටිතල පහසුකම් වර්ධනය | | | | |
| | 3.1 | සිවිල් වැඩ | 300,000,000 | 222,901,827 | 77,098,173 |
| | 3.2 | කො.ම.ස. යටිතල පහසුකම් (සවි නොකරන මෙහෙයුම් උපකරණ සැපයීම | 355,000,000 | 349,444,759 | 5,555,241 |
| | 3.3 | කො.ම.ස. හි අයකළ පොළී ගාස්තු | 22,000,000 | 20,720,465 | 1,279,535 |
| | | | --------------- | --------------- | ---------------- |
| | | එකතුව | 920,000,000 | 784,903,213 | 135,096,787 |
| | | | ======== | ========= | ========= |

6.2 භෞතික කාර්ය සාධනය

----------------------------

ව්‍යාපෘති සංරචකයන්වල ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා ව්‍යාපෘතිය ආරම්භයේදී විස්තරාත්මක කාර්ය සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, මූලා ඉලක්කයන් සහිත ක්‍රියාකාරී සැලැස්මක් වාර්ෂිකව පිළියෙල කර නොතිබුණි. එම නිසා ව්‍යාපෘතියේ කාර්යයන් නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම සතුටුදායක නොවීය. විගණනයේදී නිරීක්ෂණය වූ අවස්ථාවන් කිහිපයක් පහත විස්තර කෙරේ.

(අ). ව්‍යාපෘතියේ පහත සංරචකයන් යටතේ කොන්ත්‍රාත් පිරිනැමීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(i). එකතු වූ රොඩු ඉවත් කිරීම් ඇතුලත්ව මුහුදු මෝය අලුත් වැඩියා කිරීම

(ii). කො.ම.ස. බලප්‍රදේශයේ අලුතින් පොම්පාගාර ඉදිකිරීම සහ පොම්පාගාර පුනරුත්ථාපනය

(iii). ජා.ජ. හා ජ.ම ක්‍රියාත්මක කරන පොම්පාගාර ඉදිකිරීම/ පුනරුත්ථාපනය

(iv). කො.ම.ස. බලප්‍රදේශයේ ගුරුත්ව කාණු ඉදිකිරීම.

(ආ). පොම්පාගාර විමර්ශනය යටතේ කරන ලද කාර්යයන්, කාණු රහිත ප්‍රදේශවල අනාගත පුළුල් කිරීම් සඳහා විස්තරාත්මක සැලසුම් හා ලංසු පිළියෙල කිරීම, ද්විතීක පිළියම් කිරීම හා ඒ අනුව මූලික සැලසුම් පිළියෙල කිරීම සඳහා සැලසුම් කිරීම, GIS සිතියම්/දත්ත සමුදාය හා ජාල ආකෘති හා අත්පොත් හා මාර්ගෝපදේශ පිළියෙල කිරීම ආදිය නියමිත දිනට සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ). තවද, 2013 වර්ෂය සඳහා සැලසුම් අධීක්ෂණ උපදේශක කණ්ඩායම විසින් නියමකරන ලද ඉලක්කයන් සතුටුදායක ලෙස ළඟාකරගෙන නොතිබුණි. එම නිසා, ආයතනික සංවර්ධනය, පුහුණු වැඩසටහන් කළමනාකරණය, වත්කම් කළමනාකරණය, පද්ධතිය හා ආයෝජන සැළසුම් හි පිහිටුවන ලද ඉලක්කයන් මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරේ.